වෙලා තිබෙනවා. කොළඹ වරායට සේන්දු වෙලා තිබෙන්නේ නොවැම්බර් 05වැනි දා. ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ බාල තෙල් බෙදා හැරීමේ කුමන්ත්‍රණය පිටුපස සිදු වී තිබෙන දූෂිත ගනුදෙනුව පිළිබඳව හොයා බලන්න. ඒ වාගේම, මේ බාල තෙල් භාවිතය සඳහා නිකුත් කිරීම පිළිබඳව ඔබතුමා වහාම පරීක්ෂණයක් පවත්වා මේ සභාවට සත්‍ය තොරතුරු අනාවරණ කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

### නිෂ්පාදිත හා ආනයනික මත්පැන් සහ සීනි ආනයනය නිසා බදු අහිමි වීම
தயாரிக்கப்பட்ட மற்றும் இறக்குமதி செய்யப்பட்ட மதுபானம் மற்றும் சீனி இறக்குமதியால் ஏற்பட்ட வரி இழப்பு
LOSS OF TAX ON MANUFACTURED AND IMPORTED LIQUOR AND SUGAR IMPORTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

රජය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නාමයෙන් රටේ ජනතාවගේ කරපිට ඍජු සහ වක්‍ර බදු පටවන යුගයක, බදු ආදායම කේන්ද්‍රීය මෙම ප්‍රශ්නය මම මුදල් රාජ්‍ය අමාත්‍යවරයාගෙන් අහන්න කැමැතියි. එතුමා මේ සභාවේ සිටිනවා. මුදල් අමාත්‍යවරයා සිටියා නම් හොඳයි, මේවාට උත්තර දෙන්න. කමක් නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හරි මේවාට උත්තර දෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

දේශීය මත්පැන් නිෂ්පාදන සහ ආනයනික මත්පැන් තුළින් රජයට ඉහළ බදු ආදායමක් හිමි විය යුතුව ඇතත් නිෂ්පාදන සමාගම් විසින් යොදා ගනු ලබන විවිධ වංචාසහගත, කූට උපක්‍රම නිසා එම නියමිත බදු ආදායම එපරිද්දෙන්ම රජයට හිමි වන්නේ නැහැ. එලෙස සිදුවන වංචා පිළිබඳව ඉහළ නිලධාරින් දැනුවත් කළත් ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමක් සිදු වන්නේ නැහැ.

මම අපේ රාජ්‍ය ඇමතිතුමාට කියන්න කැමැතියි, සුරාබදු ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරින් පිළිබඳව වහාම සොයා බැලීමක් කරන්න කියලා. මම ඒ එක එක්කෙනාගේ නම් ගම් ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. නමුත් එතැන හොර ගුහාවක් තිබෙන්නේ. ඒ හොර ගුහාවෙන් රටට බදු ආදායම අහිමි කරන හොරු ටික කවුද කියන එක මේ රටට හෙළිදරව් කරන්න.

විශේෂයෙන්ම ඒ වංචා පිළිබඳව නිලධාරින් දැනුවත් වුණත් නිසි පියවරක් ගන්නේ නැහැ. එසේ පියවර නොගෙන රජය කරන්නේ කෙසේ හෝ සිය ආදායමින් රාජ්‍ය බදු ගෙවීම් කරනු ලබන පුද්ගලයන් මත තව තවත් බදු බර පටවමින් ඔවුන් පීඩාවට පත් කිරීමයි. ඒ නිසා රජයේ සුවිශේෂී අවධානය මේ කාරණාව කෙරෙහි යොමු කරවමින් මම මේ ප්‍රශ්න ගණනාව ඔබතුමාට ඉදිරිපත් කරනවා.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා VAT එක සියයට 18 දක්වා වැඩි කරන්න දක්වපු උනන්දුව වාගේම, රජය අනීතික ලෙස තුන්වැනි වතාවටත් මේ රටේ විදුලි පාරිභෝගිකයන්ගේ කරපිට, හිස මත ඒ අධික විදුලි බිල පටවන්නට බොහොම උනන්දුවෙන් කටයුතු කළා වාගේම, සුරාබදු ක්ෂේත්‍රයේ සිදුවන මෙවැනි වංචනික ක්‍රියා තුළින් රජයට අහිමිවන බදු මුදල් පිළිබඳවත් සොයා බලන්න කියා මම ඉල්ලා සිටිනවා.

මම ඔබතුමාගෙන් පහත සඳහන් ප්‍රශ්න කීපය අහන්න කැමැතියි.

01. දේශීයව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සහ ආනයනික මත්පැන් සඳහා බදු ගෙවනු ලැබූ බවට සහතික කරමින් ස්ටිකරය ඇලවිය යුතු බවට නීති පැනවීම කෙරුණේ කිනම් දවසේ සිටද? එම දිනයට ප්‍රථමයෙන් නිෂ්පාදනය කළ මත්පැන් සඳහා ද අදාළ ස්ටිකරය ඇලවිය යුතු බවට නියම කෙරුණේද? නැතහොත්, එම දිනයට ප්‍රථමයෙන් නිෂ්පාදනය කළ මත්පැන් හඳුනා ගැනීම සඳහා රජය භාවිත කළ ක්‍රමය කුමක්ද? එම ක්‍රමයෙන්ම රිංගා යමින් ඇතැම් ප්‍රමුඛ පෙළේ සමාගම් රජයට බදු ගෙවීමේදී වංචා සිදු කර ඇති බව රජය දන්නේ ද? එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර කවරේද සහ එම බදු වංචා කර ඇති ආයතන කවරේද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් හොඳින්ම දන්නා පරිදි 2019 වර්ෂයේ තමයි මේ නීතිය ආවේ. ඒ, 2128/30 දරන 2019.06.20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය මඟින්. එයින් පසුවවත් මේ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තාට පසු, මෙන්ඩිස් කොම්පැනිය කාලේ බෝතල් ලක්ෂයකට අදාළව මේ ස්ටිකර් වංචාව කරලා රුපියල් ලක්ෂ 300ක් රටට පාඩු කර තිබෙන බව අපි දන්නවා. මේවා සම්බන්ධයෙන් ගෙන තිබෙන පියවර මොනවාද කියා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒ වාගේම අලුත් stock එකක් පැරණි stock එකක් හැටියට සලකා ස්ටිකර් ගහපු ඒ වංචනික ආයතන කවරේද? ඒවාට ගත් පියවර මොනවාද?

02. දේශීය මත්පැන් වර්ග සහ ආනයනික මත්පැන් වර්ග සඳහා අය කරනු ලබන බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද? මත්පැන් නිෂ්පාදන තුළින් හිමි වන බදු ප්‍රමාණය පිළිබඳව රජය සෑහීමකට පත් වන්නේද? ඇතැම් ප්‍රමුඛ පෙළේ සමාගම් විසින් බදු ගෙවනු ලැබූ බවට සහතික කරමින් අලවනු ලබන ස්ටිකරය වංචා සහගත ලෙස මුද්‍රණය කර සිය නිෂ්පාදනවලට යොදා ගැනීම මඟින් රජයට බදු ගෙවීම පැහැර හැර ඇති බව අමාත්‍යවරයා දන්නේද? එසේ නම්, හොර ස්ටිකර් යොදා ගනු ලැබූ සමාගම්වලට එරෙහිව රජය ගත් පියවර කුමක්ද?

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම මේ කාරණය පැහැදිලි කරන්න කැමැතියි. විවිධ කණ්ඩායම් ගිහිල්ලා -2023 ජනවාරි 18වන දාත් ගිහිල්ලා- සාම්පල් සහිතව ඒ හොර ස්ටිකර් ගැන සුරාබදු කොමසාරිස්වරයා දැනුවත් කරලා තිබෙනවා. නමුත්, කිසිම action එකක් අරගෙන නැහැ. Action එකක් නොගත්තු ඒ සුරාබදු කොමසාරිස්ට එරෙහිව ඔබතුමා ගන්නා action එක මොකක්ද? ඔබතුමා ගන්නා පියවර මොකක්ද? අපි ඒකත් දැනගන්න කැමැතියි.

03. මෙරට මත්පැන් නිෂ්පාදනය කරනු ලබන සමාගම් මොනවාද? ඒ ලැයිස්තුවත් කරුණාකර ඉදිරිපත් කරන්න. එම සමාගම් අතුරින් සිල්ලර වෙළඳ බලපත්‍ර හිමිව ඇති සමාගම් මොනවාද? මත්පැන් නිෂ්පාදින සමාගම්වලට සිල්ලර වෙළඳාම් - retail business - කළ නොහැකි බවට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සුරාබදු පනත මඟින් නියෝග පනවා ඇති බව රජය නොදන්නේද? ඒ බව දන්නේ නම්, මත්පැන් නිෂ්පාදනය කරනු ලබන සමාගම්වලට සිල්ලර වෙළඳ බලපත්‍රයන් ලබා දුන්නේ කුමන පදනමක් මත ද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මත්පැන් නිෂ්පාදන සමාගම් retail business කරන එක සුරාබදු නිවේදන 791, 792, 793, 794 සහ 795 මඟින් නීත්‍යනුකූල නොවන ක්‍රියාවක් බවට පත් කර තිබෙනවා. ඒ බව බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. එවැනි නීතියක් තිබියදී, කොහොමද මත්පැන් නිෂ්පාදන සමාගම් retail businessවල නිරතව ඉන්නේ? ඒ කියන්නේ, රජය, ඔබතුමන්ලා, ඒ අදාළ නිලධාරින් හිතාමතා මේ රටේ නීතිය කඩ කරනවා. මම අහන්න කැමැතියි, ඔබතුමා මේ කාරණාව සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියලා.

04. එක් එක් දිස්ත්‍රික්ක තුළ මත්පැන් අලෙවිසැල් සඳහා බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකි ද? ඔබතුමන්ලා පසුගිය කාලයේ මන්ත්‍රී නිර්දේශ මත බියර් බලපත්‍ර ලබා දුන්නා, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගන්න කියලා. හැබැයි, සංචාරක ව්‍යාපාරය පැත්ත පළාතකවත් නැති සමහර ගම්මාන තුළ විහාරස්ථාන අසල ස්ථානවලටත් ඒ බියර් බලපත්‍ර දීලා තිබෙනවා. කරුණාකර ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්න. එම ලැයිස්තුව තුළ එක් දිස්ත්‍රික්කයක් ඇතුළත බලපත්‍ර දෙකකට වඩා හිමි පුද්ගලයන් ඉන්නවාද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා රටේ නීතිය ගැන. කෙනෙකුට එවැනි බලපත්‍ර දෙකකට වඩා තියාගන්න බැහැ. නමුත්, සමහරු එහෙම තියාගෙන ඉන්නවා. ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්න. එසේ නම්, එය පවතින නීතිය උල්ලංඝනය කිරීමක් හැටියට ඔබතුමා සලකන්නේ නැද්ද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි මේ කාරණයත්. මිනිසුන්ට බදු පිට බදු බර පටවා රාජ්‍ය ආදායම වැඩි කර ගන්නට අද ඔබතුමන්ලා බොහොම උනන්දුවෙන් කටයුතු කරනවා. නමුත්, රුපියල් බිලියන 50කට වැඩි ආදායමක් අහිමි වෙලා තිබෙනවා, මේ අරක්කු කොම්පැනිවලට තමුන්නාන්සේලා ලබා දී තිබෙන මේ අනීතික සහනය තුළින්. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? ඔබතුමා දැන ගන්නට ඕනෑ, මිලිලීටර 750ක ගල් අරක්කු බෝතලයකින් අඩුම ගණනේ රුපියල් 2,400ක බදු වංචාවක් අනිවාර්යයෙන් සිදු වෙනවා කියලා. ඒ පිළිබඳව ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද? ඔබතුමන්ලා මිනිසුන්ට බදු ගහන්න දක්ෂයි. නමුත් මෙවැනි කටයුතු කරන අරක්කු කොම්පැනිවලට කරන්නේ මොකක්ද කියා අපට දැන ගන්න ඕනෑ.

05. මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් විවිධ ක්‍රම යොදා ගනිමින් මත්පැන් පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබන බව රජය දන්නේද? එය 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත උල්ලංඝනය කිරීමක් නොවන්නේද? එලෙස ප්‍රචාරණ කටයුතු කිරීම වැළැක්වීම සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද? මත්පැන් භාවිතය නිසා සිරුරට ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ මහ ජනයා දැනුවත් කිරීමක් අදාළ මත්පැන් නිෂ්පාදන ඇසුරුමේ සඳහන් වන්නේද? නො එසේ නම්, ඒ සඳහා නිසි පියවර ගැනීම රජයේ වගකීමක් නොවන්නේද?

06. 2020 බදු සංශෝධනය මඟින් රාජ්‍ය බදු ආදායම කොපමණ ප්‍රමාණයකින් අඩු වීද? එය සමස්තයක් ලෙස කොපමණ ප්‍රතිශතයක්ද? එය දළ දේශීය නිෂ්පාදිතයට කරන ලද බලපෑම කෙබඳුද? රජය හඳුන්වා දුන් Advance Personal Income Tax - APIT - මඟින් කොපමණ ආදායමක් රජය අපේක්ෂා කළේද? දැනට එමඟින් කොපමණ ආදායමක් උපයා තිබේද? එය අපේක්ෂිත ආදායමින් කොපමණ ප්‍රතිශතයක්ද? තවත් කොපමණ ප්‍රමාණයක් එමඟින් ඉපයීමට රජය අපේක්ෂා කරන්නේද?

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන්ම රටට හෙළිදරව් වෙනවා, මේ රටේ වෘත්තීයවේදීන් - professionalsලා - වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, තොරතුරු තාක්ෂණවේදීන් ආදි වෘත්තීය ක්ෂේත්‍රයේ සියලුදෙනාට පනවා තිබෙන APIT එකෙන්, බලාපොරොත්තු වුණු target එකටත් වඩා revenue එකක් ලැබී තිබෙන බව; රාජ්‍ය ආදායම ලැබී තිබෙන බව.

ඉතින් මේ රටේ බුද්ධි ගලනය සිදු වෙනවා කියන එක පුදුමයක්ද? ඒක පුදුමයක් නොවෙයි. ඔබතුමන්ලා වෘත්තීයවේදීන්ට tax ගහන්න උනන්දු වෙනවා. හැබැයි අරක්කු කොම්පැනිවලට, මත්පැන් කොම්පැනිවලට tax ගහන්න තමුන්නාන්සේලා භයයි. හොර වැඩ කළ අය නීතිය හමුවට ගෙනෙන්න තමුන්නාන්සේලා භයයි. මොකක්ද හේතුව?

07. බදු නොගෙවූ අරක්කු සමාගම් 5ක බලපත්‍ර අත්හිටවූ බව පසුගිය දිනවල පුවත් පත් මඟින් වාර්තා වුණා. මෙය සත්‍යයක්ද?

ඒක සත්‍යයක් නම් ඔබතුමන්ලා හොඳ පැත්තකට අඩි කිහිපයක් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා.

එම සමාගම් කවරේද? ඒවා නම් කරන්න. එම සමාගම් බදු නොගෙවීම නිසා රජයට අහිමි වූ සමස්ත බදු ආදායම කොපමණද? එම බදු නැවත අය කර ගැනීම සඳහා රජය කටයුතු කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. කරුණාකරලා මේ අහිමි වුණු බදු නැවත අය කර ගැනීම සහන ක්‍රමයකට ක්‍රියාත්මක කරන්න එපා. මොකද, මේ කරලා තිබෙන්නේ වංචාවක්, වංචනික ක්‍රියාවක්. මේ රටේ පොදු ජනතාවගේ කර මත බදු බර පටවනවා වෙනුවට මේ වාගේ බදු නොගෙවන අරක්කු සමාගම්වලින්, මත්පැන් සමාගම්වලින් අය විය යුතු මුදල වහා අය කර ගන්නට, -එක එක ඩීල් දාගෙන සහන ක්‍රම හදා ගන්නේ නැතිව- ඉක්මන් ක්‍රමයකට යන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

08. රජය විසින් පසුගිය නොවැම්බර් 02වෙනි දා මධ්‍යම රාත්‍රියේ සිට සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා පැවති සත 25ක බද්ද යළිත් වරක් රුපියල් 50 දක්වා ඉහළ දමනු ලැබීය. 2023 වසර තුළ මේ දක්වා එක් එක් මාසයේ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගන්නා ලද සීනි තොග ප්‍රමාණය කොපමණද?

කොටින්ම කියනවා නම්, කොම්පැනි කීයකට ආරංචිය ගියාද, සත 25 සිට රුපියල් 50 දක්වා බද්ද වැඩි කරනවා කියලා? කෙටි කාලයක් තුළ ඉක්මනින්ම මෙරටට සීනි ආනයනය කර සත 25 බද්දට නිදහස් කර ගන්නට කටයුතු කළ ඒ කුමන්ත්‍රණය පිටුපස සිටියේ කවුද, මොන කොම්පැනිද? ඒ තුළින් රජයට කෝටි 100කට වැඩි බදු ආදායමක් අහිමි වුණා කියලා වාර්තා වෙනවා. ඒ පිළිබඳ පැහැදිලි විස්තරයක් මේ සභාවට ලබා දෙන්න.

සාමාන්‍යයෙන් මසකට ආනයනය කරනු ලබන සීනි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මෙම බදු වැඩි කිරීමට

ආසන්නතම කාලය තුළ ආනයනය කර තිබේද? එසේ සිදු වූයේ නම් රජය බදු වැඩි කිරීමට බලාපොරොත්තු වන බව සීනි ආනයනය කරන සමාගම් දැන සිටියේද?

ඒ තුළින් අයථා ලාභයක් එම සමාගම් මීට පෙරද ලබා ගත් බව රජය නොදන්නේද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මීට පෙර සීනි බදු වංචාවක් සිද්ධ වුණාය කියලා ඔබතුමාත් හොඳින්ම දන්නවා. ඒ සඳහා අද වෙනකල් -මේ මොහොත වෙනකල්- කිසිම දෙයක් කරලා නැහැ. අපි පැහැදිලිවම දන්නවා, සමාගම් ගණනාවක් මේ රජය ජයග්‍රහණය කරවන්නට මූල්‍ය පරිත්‍යාග කළ බව. ඒවා එළිපිටම කරපු දේවල්; එළිපිටම ලබා දුන් අනුග්‍රහ. එම නිසා මේ ගජ මිතුරු කුමන්ත්‍රණය තුළින් රටට අහිමි වුණු ආදායම පිළිබඳව කරුණාකර මේ සභාව දැනුවත් කරන්න.

මෙම බදු වංචාව තුළින් එම සමාගම් අයථා ලාභයක් ලබා ගත් බව ගරු ඇමතිවරයා නොදන්නේද? රජය සීනි මිල වැඩි කිරීමට ආසන්නතම කාලය තුළ ඉතා විශාල ලෙස සීනි තොග නිදහස් කිරීම සිදු කර ඇති බව රජයට මීට පෙර වාර්තා වුණේ නැද්ද? ආසන්නතම මාසය තුළ සීනි තොග නිදහස් කරගනු ලැබූ ආනයනකරුවන්ගේ ලැයිස්තුවක් සහ එසේ නිදහස් කර ගන්නා ලද සීනි ප්‍රමාණය වෙන් වෙන් ලෙස මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? කිලෝග්‍රෑම් එකකට ශත 25ක බදු මුදලක් පමණක් ගෙවා නිදහස් කර ගන්නා ලද සීනි, වෙළෙඳ පොළට ඉදිරිපත් කරනුයේ පනවන ලද රුපියල් 50ක නව බදු මුදලද ඇතුළත්ව උපරිම මිලට නොවේද? එසේ නම් මේ තුළින් රජයට සිදු වන බදු අහිමි වීම කොපමණද? ඒ සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රියාමාර්ගය කවරේද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම කරුණු කාරණා සම්බන්ධයෙන් විස්තරාත්මක පිළිතුරක් මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා මේ මෘදු මත්පැන් බලපත්‍ර ලබා දීම තුළින් NATA Act එකත් violate කරලා තිබෙනවා වාගේම, විශේෂයෙන්ම මේ රටේ මත් පැන් ප්‍රවර්ධනය කරන්නත් කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම මහජන මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තුවලට මෘදු මත්පැන් බලපත්‍ර ලබා දීම, මේ රට මතින් තොර රටක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තියට සමානද, පටහැනිද කියන එක ගැනත් විග්‍රහයක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා විසින් චෝදනාවක් එල්ල කළා, ප්‍රමිතියෙන් තොර ඉන්ධන ආනයනය කිරීමක් සහ බෙදා හැරීමක් සිදු කරන බවට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට කිසිම ආකාරයකින් ප්‍රමිතියෙන් තොර ඉන්ධන ආනයනය කරලාත් නැහැ, බෙදා හැරීමක් කරලාත් නැහැ කියන එක පළමුවෙන්ම මම කිව යුතුයි. මෙතුමා කියන කාරණාව අද "අරුණ" පුවත් පතත් වාර්තා කරලා තිබෙනවා. එය වැරදි පුවතක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ඉන්දියානු ඔයිල් සමාගම විසින් ඔක්ටේන් 92 සහ ඔටෝ ඩීසල් ආනයනය කරලා තිබෙනවා. ඊයේ රාත්‍රී ඒ නෞකාවේ තිබූ ඔක්ටේන් 92 ඉන්ධන ටික තත්ත්ව පරීක්ෂණයෙන් පසුව ගොඩබාලා තිබෙනවා. ඩීසල්වල යම් සැකයක් තිබෙන නිසා පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබෙනවා. අපි ඒ ඩීසල් තොග ගොඩබාලා නැහැ. සාමාන්‍ය ක්‍රමය තමයි ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ඉන්ධන පිළිබඳව පරීක්ෂණ කටයුතු කරලා යම් කිසි ආකාරයකින් එම ඉන්ධන ප්‍රමිතියෙන් තොරයි කියලා තහවුරු වුණොත්, එම ඉන්ධන ගොඩ බාන්නේ නැහැ. එම ඉන්ධන අපි නැවත යවනවා. නමුත්, අපේ ප්‍රමිතියට ගැළපෙනවා කියලා පරීක්ෂණවලින් සනාථ වුණොත් ගොඩ බෑමේ කටයුතු කරනවා. ඒ නිසා එම ඉන්ධන තොග පිළිබඳව මේ මොහොත වනකොටත් පරීක්ෂණ කටයුතු පැවැත්වෙනවා. කිසිම ආකාරයකින් එම ඩීසල් තොග ගොඩබෑම කරලාත් නැහැ, බෙදා හරින්න කටයුතු කරලාත් නැහැ. "අරුණ" පුවත් පතේ පළ වී තිබෙන්නේ වැරදි පුවතක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිවරණයට එතුමන්ලාගේ නායකයා ඉදිරිපත් වන නිසා වෙන්න ඇති, පුවත් පතේ එහෙම පළ කර තිබෙන්නේ. මෙවැනි සාවද්‍ය පුවත් පළ කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලාත් ඉල්ලීමක් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය ඇහුවේ ඒ පුවත් පත කේන්ද්‍ර කරගෙන නොවෙයි, මට ලැබුණු තොරතුරු කේන්ද්‍ර කරගෙන. ගරු ඇමතිතුමනි, "FOS POWER" කියන නෞකාවෙන් ගෙනෙන ලද ඉන්ධන සාම්පල පරීක්ෂාවක දී ඒවා ගුණාත්මකභාවයෙන් පහළ ඉන්ධන කියලා රසායනාගාර පරීක්ෂණ වාර්තා දෙකක සඳහන් වෙලා තිබෙනවා. "ගුණාත්මකභාවයෙන් පහළ ඉන්ධන" කියලා එසේ රසායනාගාර වාර්තා දෙකක් ඉදිරිපත් කර තිබෙනවා ද? ඔබතුමා ඒක තහවුරු කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත වතාවක් මෙය කියනවා. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තයේ නිලධාරින් එක්ක අද උදේත් මම කථා කළා. ඔවුන් ඔක්ටේන් 92 පරීක්ෂාවට ලක් කරලා ප්‍රමිතියට අනුකූල නිසා ගොඩ බාලා තිබෙනවා. ගත්ත ඩීසල් සාම්පල් එකේ ඔවුන් යම්කිසි දෙයක් දැකලා තිබෙනවා; නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ සාම්පල පරීක්ෂාවට ලක් කරලා නොවෙයි, නිරීක්ෂණයක්. ඒ නිසා දැන් LIOC එකත්, එම නැව් සමාගමත්, තෙල් ආනයනය කරපු සමාගමත්, ස්වාධීන පරීක්ෂණ කණ්ඩායමකුත් එම ස්ථානයට ගිහින් ඉන්නවා සාම්පල අරගෙන පරීක්ෂා කරන්න. එහි සාම්පල තවමත් පරීක්ෂණයට ලක් වෙමින් පවතිනවා. විපක්ෂ නායකතුමාට ලැබුණු තොරතුරු අනුව, රසායනාගාර පරීක්ෂණ දෙකක් කරලා තිබෙනවා. ඒවා ප්‍රමිතියෙන් තොර බවට සනාථ වෙලා නැහැ. ඔවුන්ට නිරීක්ෂණය වූ දෙයක් නිසා තමයි තවදුරටත් පරීක්ෂණ කරන්න ඕනෑ කියලා තීන්දු කරලා තිබෙන්නේ. ඒ අනුව එම පරීක්ෂණ මේ මොහොතේත් සිදු වනවා. එම නෞකාවෙන් කිසිම ආකාරයකින් ඩීසල් තොග ගොඩ බෑමක් කරලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමනි, රසායනාගාර පරීක්ෂණ අවසන් වුණාට පස්සේ එම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ ඇසූ ප්‍රශ්නයට මුදල්, ආර්ථික ස්ථායීකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුර ලබා දෙනවා.

ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රශ්නය ස්ටිකරය ඇලවීමෙන් ආරම්භ වෙලා, උපයන විට බදු හරහා සීනි බද්ද දක්වා කරුණු විමසා තිබෙනවා. මෙම ප්‍රශ්නය මට ලැබුණේ ඊයේ. එම නිසා සමහර තොරතුරු රැස් කර ගන්න අසීරු වුණා. මේ වෙලාවේ කථා කළ යුතු, පැහැදිලි කර ගත යුතු ඉතා වැදගත් ප්‍රශ්න කිහිපයක් එතුමා නඟා තිබුණු නිසා, තිබෙන තොරතුරු සමඟ කරුණු පැහැදිලි කරන්න මම කල්පනා කළා. ඒ සමහර තොරතුරු සපයන්න  මට සතියක විතර කාලයක් අවශ්‍ය වේවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුරාබදු වංචා වැළැක්වීමට වැඩිම පියවර ගත් යුගය තමයි මේ යුගය. 1912 දී තමයි සුරාබදු ආඥා පනත සකස් කළේ. එදා සිට ආපු යුගය බැලුවොත්, ඉතාම විප්ලවකාරී පියවරක් තමයි ස්ටිකරය හඳුන්වා දීම. ඒකේ ප්‍රශ්න තිබෙනවා. ඒකට හැම පාර්ශ්වයකින්ම විශාල අභියෝග එනවා. එය හරියාකාරව ක්‍රියාත්මක කළොත් එය රාජ්‍ය ආදායම වර්ධනයට විශාල පිටුවහලක් වෙනවා. ඒ නිසා විවිධ පාර්ශ්වවලින් මේ නීතියට විවිධාකාර ප්‍රහාර එල්ල වෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. 2018.03.25 සහ 2018.06.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්ටිකර් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපාදන සැලසීම සඳහා සුරාබදු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දී ඇත. ඒ අනුව, 2019.06.19 දින සිට මෙය ක්‍රියාත්මක කර ඇත. මුලින්ම මෙම ක්‍රමය මත්පැන් ආනයනකරුවන් සඳහා පමණක් ක්‍රියාත්මක කළ අතර, 2022.01.03 දින සිට සියලු මත්පැන් නිෂ්පාදකයන්ට අදාළ වන පරිදි මෙය ක්‍රියාත්මක කරන ලදි.

    මෙම ආරක්ෂිත ස්ටිකර් හඳුන්වා දුන් පසු 2021 වර්ෂයේදී සුරාබදු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 19ක වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදනයත් සියයට 11ක වර්ධනයක් වාර්තා කළා. ශ්‍රී ලංකාව තුළ අළෙවි වන නීත්‍යානුකූල නොවන මත්පැන්  අවම කිරීමටත්, ලැබිය යුතු ආදායම් විධිමත් පරිදි ලබා ගැනීමටත් මෙම ස්ටිකර් ක්‍රමය භාවිත කරන ලදී.

02. දේශීය මත්පැන් වර්ග සහ ආනයනික මත්පැන් වර්ග සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් සුරාබදු නිවේදන 02/2023හි දක්වා තිබේ. මේ සුරාබදු නිවේදනයේ ඉතා පැහැදිලිව මේ තොරතුරු තිබෙනවා. මත්පැන් නිෂ්පාදනය තුළින් හිමිවන බදු ප්‍රමාණය පිළිබඳව රජය සෑහීමකට පත් වෙන්නේ නැත. ඔබතුමා පෙන්වා දුන් කරුණු පිළිබඳව අපි දැඩිව සොයා බලනවා. වර්තමානයේ ලැබෙන සුරාබදු ආදායම ක්‍රමිකව වර්ධනය කර ගැනීම සඳහා උපාය මාර්ග යෝජනා කර ඇත.

    ප්‍රමුඛ පෙළේ ඇතැම් සමාගම් විසින් බදු ගෙවනු ලබන බවට සහතික කරමින් අලවනු ලබන ස්ටිකරය වංචා සහගත ලෙස මුද්‍රණය කර සිය නිෂ්පාදනවලට යොදා ගැනීම මඟින් රජයට බදු ගෙවීම පැහැර හැර ඇති බව දන්නෙමි. එසේ ව්‍යාජ ස්ටිකර් යොදා ගනු ලැබූ සමාගම්වලට එරෙහිව රජය පියවර ගෙන ඇත. එහිදී ව්‍යාජ ස්ටිකර් බවට සැක කරන ලද ස්ටිකර් යොදා ගන්නා ලද බවට චෝදනා එල්ල වූ සමාගම් සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් පහත දණ්ඩනීය ක්‍රියාමාර්ග ගෙන ඇත.

    - කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කොට ඒවා මත උපරිම සමථ ගාස්තුව පැනවීම.
    - සොයා ගන්නා ලද මත්පැන්වලට අදාළව අය විය යුතු සුරාබද්ද අයකර ගැනීම.
    - අදාළ සුරාබදු මත සියයට 3 බැගින් වූ මාසික ප්‍රමාද ගාස්තුවක් අය කිරීම.
    - ව්‍යාජ ස්ටිකර සහිත මත්පැන් බෝතල් සියල්ල රාජ සන්තක කිරීම.
    - සමාන ආකාරයේ වරදක් සම්බන්ධයෙන් නැවත වරදකරු වීමේදී සුරාබදු බලපත්‍ර අත්හිටුවන බවට තදින් අවවාද කිරීම.

    එසේ වුවත්, එම ව්‍යාජ ස්ටිකර්වල මූලාශ්‍රය සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන පැවැත්වේ.

03. මෙරට මත්පැන් නිෂ්පාදනය කරනු ලබන සමාගම් පිළිබඳ ලේඛනය ඇමුණුම 01 ලෙස පිළිතුරට යා කර ඇත. අවශ්‍ය පරිදි ඔබතුමාට එම ලේඛනය පරිශීලනය කරන්න පුළුවන්. එය දීර්ඝ ලේඛනයක්.

    එම සමාගම් අතරින් කිසිදු සමාගමකට මත්පැන් සිල්ලර වෙළඳ බලපත්‍ර ලබා දී නොමැත. මත්පැන් නිෂ්පාදිත සමාගම්වලට සිල්ලර වෙළෙඳාම සිදු කළ නොහැකි බවට සුරාබදු පනත මඟින් නියෝග පනවා ඇත. එසේම මත්පැන් නිෂ්පාදනය කරනු ලබන සමාගම්වලට සිල්ලර වෙළෙඳ බලපත්‍රයක් කිසිදු ආකාරයකින් ලබා දී නොමැත. සෑම නිෂ්පාදන සමාගමක්ම ඊට අනුබද්ධ බලපත්‍රයක් නොමැතිව හෝ යම් ආකාරයකින් සිල්ලර වෙළෙඳාමේ යෙදුනහොත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනිමින් පවතී. සෘජුව හෝ වක්‍රව එවැනි කටයුතුවල යෙදීම වැළැක්වීමට පියවර ගැනීමට කටයුතු කරමින් ඇත.

මොකද, කිසිදු අයෙකුගේ නමින් මේ අළෙවි සැල් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම හැම දිස්ත්‍රික්කයකින්ම මේ පිළිබඳ වාර්තාවක් ලබා ගත්තා. නමුත්, මෙතුමා පෙන්වා දුන් කරුණු අනුව යම් ආකාරයකින් වක්‍රව එය සිදු වෙනවා නම්, ඒ සම්බන්ධව පියවර ගැනීම සඳහා අපි ක්‍රියාමාර්ග සකස් කරමින් යනවා.

04. එක් එක් දිස්ත්‍රික්ක තුළ මත්පැන් අළෙවි සැල් සඳහා බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කළ හැක.

මට ඒ සඳහා සතියක කාලයක් අවශ්‍ය වෙනවා. ඒකට දීර්ඝ විස්තරයක් ලබා දෙන්න ඕනෑ. මොකද, 4,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා.

එක් දිස්ත්‍රික්කයක් ඇතුළත බලපත්‍ර දෙකකට වඩා හිමි පුද්ගලයන් පිළිබඳව නිරීක්ෂණය කොට නොමැත. එහෙත් ඒ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කොට වාර්තා කළ හැකිය. සුරාබදු නිවේදන 902හි 25වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික්කයක් ඇතුළත යම් අයෙකුට බලපත්‍ර දෙකකට වඩා නිකුත් කිරීමෙන් එම සිද්ධාන්තය ඇතුළත් මත්පැන් ඒකාධිකාරයකට හෝ අනවශ්‍ය මත්පැන් පාලනයකට හෝ නිදහස් බාධා රහිත සැපයුම් බෙදා හැරීමට හෝ පරිභෝජනයට හෝ අවසර ඇති වීමේ තත්ත්වයකට තුඩු නොදෙන තත්ත්වයක් යටතේ එක් ඉල්ලුම්කරුවෙකුට එක් දිස්ත්‍රික්කයක් ඇතුළත බලපත්‍ර දෙකකට වඩා නිකුත් කිරීමේ අභිමතය සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට ලබා දී ඇත.

නිෂ්පාදකයෙකුට සිල්ලර වෙළෙඳාම කළ නොහැකි වුණත්, කලින් කියන ලද ප්‍රශ්න ඇති නොවෙයි කියා විශ්වාස කරනවා නම්, එක් දිස්ත්‍රික්කයකට බලපත්‍ර දෙකකට වඩා නිකුත් කිරීමේ අභිමතය සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

05. මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් විවිධ ක්‍රම යොදා ගනිමින් මත්පැන් පිළිබඳ සිදු කරන ප්‍රචාරණ කටයුතු අවම කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව පරිපාලනමය හා නෛතික වශයෙන් පියවර ගනු ලබන අතර, නෛතික විධිවිධාන උල්ලංඝනය කිරීම පිළිබඳව අදාළ බලපත්‍රධාරීන්ට එරෙහිව කටයුතු කර ඇත. එවැනි ක්‍රියා මඟින් 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත උල්ලංඝනය වේ. 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනතෙහි විධිවිධානවලට අනුකූලව මත්පැන් පිළිබඳ ප්‍රචාරණ කටයුතු අධෛර්යවත් කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත.

ඒ පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව ක්‍රියා කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. මත්පැන් භාවිතය නිසා සිරුරට ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව මහජනයා දැනුවත් කිරීමක් අදාළ මත්පැන් නිෂ්පාදන ඇසුරුමේ සඳහන් වන්නේ නැත. කෙසේ වෙතත්, මෙම ප්‍රචාරණ කටයුතු දැනට ශ්‍රී ලංකාව තුළ තහනම් වන අතර, ඒ සම්බන්ධයෙන් නිසි අධිකාරයක් විසින් අධීක්ෂණය සිදු කරනු ලැබේ. මතවාදයට තුඩු දී ඇති මෙම වසර තුළ දෙවතාවකදී සුරාබදු සියයට 40කින් අය කිරීම ද මත්පැන් භාවිතය අධෛර්යවත් කිරීමට ගත් පියවරකි.

ඒ වාගේම සැලකිය යුතු තවත් කරුණක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මත්පැන් ගැන අපි කථා කරද්දී, නීත්‍යනුකූල මත්පැන් නිෂ්පාදනයට වඩා වැඩි වේගයකින් නීත්‍යනුකූල නොවන මත්පැන් නිෂ්පාදනයේ වර්ධනයක් මේ රටේ හැම තැනකම තිබෙනවා. අපි ඒ පිළිබඳව කථා කරන්නේ ඉතාම අල්ප වශයෙන්. මම පැහැදිලිව කියන්න අවශ්‍යයි, මන්ත්‍රී ලැයිස්තුවලට මෘදු මත්පැන් බලපත්‍ර නිකුත් කළේ නැහැ කියන එක. ඒවා නිකුත් කළේ සංචාරක අමාත්‍යාංශයේ බලපත්‍ර මත. එසේ වුවත්, ඒ පිළිබඳව අපි උනන්දු විය යුතුයි. හැබැයි, ඒ උනන්දුව මත අපි ගම් පුරා, පඳුරක් ගානේ තිබෙන නීතිවිරෝධී මත්පැන් පිළිබඳව හොයන්නේ නැති එක ගැන නම් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

06. 2019 වසරේ රාජ්‍ය බදු ආදායම රුපියල් බිලියන 1,734.9ක් වූ අතර, 2020 වසරේ එය රුපියල් බිලියන 1,216.5ක් විය. 2020 වර්ෂයේ රාජ්‍ය බදු ආදායම 2019 වසරට සාපේක්ෂව සියයට 29.8කින්, එනම් රුපියල් බිලියන 518.4ක ප්‍රමාණයකින් අඩු විය.

දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ගත් කල අඩු වූ රාජ්‍ය බදු ආදායම සියයට 3.1කි. එනම්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය බදු ආදායම, 2019 වසරේ පැවති සියයට 10.9 ක සිට 2020 වසරේ දී සියයට 7.8ක් දක්වා අඩු විය.

ඒ අනුව, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම අඩුම රටක් බවට අපේ රට පත් වුණා.

රජය විසින් හඳුන්වා දුන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද - APIT - මඟින් 2023 වසර සඳහා රුපියල් බිලියන 100ක මුදලක් අපේක්ෂා කරන ලදී. 2023.09.30 තෙක් APIT මඟින් ලද ආදායම රුපියල් බිලියන 107.1ක් විය. ඒ අනුව, මෙම වසරේ මුල් මාස නවය තුළ අපේක්ෂිත ආදායමෙන් සියයට 107ක් ළඟා කරගෙන ඇත. ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වන ඉදිරි මාස තුනක කාලය ඇතුළු මුළු වසර සඳහා මෙම වසරේ මුල් මාස නවය තුළදී ලද ආදායම පුරෝකථනය කළ විට රුපියල් බිලියන 150ක පමණ අගයක් ළඟා කරගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. එය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමින් සියයට 150ක් වේ. අනෙකුත් බදු පදනම පුළුල් කර ගැනීමට රජය ගෙන යන දැඩි වෑයම සාර්ථක වූ විට මෙවැනි නිශ්චිත ආදායම් ලබන පාර්ශ්වවල බදු බර සැහැල්ලු කිරීමේ අනාගත බලාපොරොත්තුවක් රජය තුළ තිබෙනවා. අපි දන්නවා, ස්වයංව බදු තීරණය කරන රටක උපයන විට බද්ද වාගේ දෙයක් නිශ්චිතවම අය වෙන බව. ඉතින්, ඔවුන් දරන්නා වූ බර පිළිබඳව ලොකු හැඟීමක් රජය තුළ තිබෙනවා. එම නිසා යම් අවස්ථාවක මේ බදු පදනම පුළුල් වූ විට ඔවුන්ගේ බදු බර ලිහිල් කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

07. බදු නොගෙවූ අරක්කු සමාගම් 5ක බලපත්‍ර අත්හිටවූ බව පසුගිය දිනවල පුවත් පත් මඟින් වාර්තා විය. 2023.10.30 දින වන විට 2023 සඳහා නියමිත බදු ගෙවීමට අපොහොසත් වන මත්පැන් නිෂ්පාදන සමාගම් 5කට අදාළ සුරාබදු බලපත්‍ර අත්හිටුවන බව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් එම සමාගම් වෙත ලිඛිතව දැනුම් දී තිබූ අතර, එම සමාගම්වලට අදාළ සුරාබදු නිෂ්පාදන බලපත්‍රවල වලංගු කාල සීමාව 2023.10.30 දිනෙන් අවසන් වීමට ද නියමිතව තිබුණි.

ඉන් එක් නිෂ්පාදනාගාරයක් හෙවත් සීමාසහිත රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම අභියාචනාධිකරණ නඩු අංක CA(Writ)/649/2023 යටතේ අධිකරණමය ක්‍රියාමාර්ගයකට පිවිසීම හේතුවෙන් එම නිෂ්පාදනාගාරයට අදාළ සුරාබදු බලපත්‍රවල වලංගු කාල සීමාව ඊළඟ නඩු දිනය තෙක් හෙවත් 2023.11.13 දින තෙක් දීර්ඝ කරන ලදී. එහෙත් අනෙක් නිෂ්පාදනාගාර 4 නියමිත බදු ප්‍රමාණය ගෙවීමට අපොහොසත් වූයෙන් ඒවායේ බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ නොකිරීමට කටයුතු කරන ලදී. එම සමාගම් නම්,

I. සීමාසහිත ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සහ සමාගම

II. සීමාසහිත පින්ලන්ඩ් ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම

III. සීමාසහිත සිනර්ජි ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම

IV. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම.

ගණනය කර ඇති පරිදි එම සමාගම් බදු නොගෙවීම නිසා රජයට දැනට අය කරගත යුතුව ඇති සමස්ත බදු ආදායම හා ප්‍රමාද ගාස්තු ඇමුණුම 02හි දැක්වේ. එම බදු නැවත අය කර ගැනීම සඳහා රජය දැඩි පියවර ගැනීමට කටයුතු කරමින් පවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රථම වතාවට තමයි මේ බලපත්‍ර දීම කල් දැම්මේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇමුණුමේ සඳහන්ව තිබෙන පරිදි, බදු අහිමි වීමෙන් වූ පාඩුව කොච්චරද කියන්න පුළුවන්ද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ඔබතුමා මට කාලය දෙනවා නම් ඒ ගැන කියන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මම ඒ සමාගමේ නම කිව්වා, ගරු විපක්ෂ නායකතුමනි. ඒ සමාගම තමයි සීමාසහිත රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් (පුද්ගලික) සමාගම. ඇමුණුම 02හි සඳහන් සමාගම්වලින් අපට ලැබිය යුතු සම්පූර්ණ බදු මුදල් ප්‍රමාණය

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

රුපියල් මිලියන 2,715ක්. පමා වෙන හැම මාසයකටම බදු වශයෙන් තවත් සියයට 3ක් අපි අය කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ප්‍රමාද ගාස්තුව රුපියල් මිලියන 4,005ක්. ඒ අනුව රුපියල් මිලියන 6,721ක් මේ සමාගම් අපට දෙන්න ඕනෑ. පමා වෙන හැම මාසයකට අපි සියයට 3ක් අය කරනවා. එක දිනයක් ප්‍රමාද වුණත් ඒ මාසයේ ගණන දිනයට අදාළව ගණනය කරලා අය කරනවා. ඒ නිසා කිසිම ලිහිල් කිරීමක් නැහැ. මේ ආයතන සියල්ලම ගැන කියන්න අවශ්‍ය නැහැ. මට ඒ ගැන කියන්න සෑහෙන වෙලාවක් ගත වේවි. ඒ තොරතුරු ඇමුණුම 02හි සඳහන් කරලා තිබෙනවා. මේක රහස්‍ය ලියවිල්ලක් නොවෙයි. ඕනෑ කෙනෙකුට මේ ලියවිල්ල පරීක්ෂා කරන්න පුළුවන්. මේ සමාගම් සපුරා වහලා දැම්මාම අපට මේ බදු ආදායම අයකර ගන්න බැහැ.

කෙසේ වුවද, ඔවුන්ගෙන් ලද අභියාචනා සහ ප්‍රායෝගිකව මෙම බදු මුදල් අය කරගැනීමේ අවශ්‍යතාව මත එම සමාගම් සඳහා ගෙවීම් සැලසුම් ලබා දී ඇති අතර, එම ගෙවීම් සැලසුම් අනුව ගෙවීම් කිරීමට එම සමාගම් දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගත වී ඇත. එකී ගිවිසුම් අනුව 2023 හිඟ බදු ගෙවීම සඳහා 2023.12.29 දින තෙක් කල් ලබා දී ඇත. නියමිත දින හෝ ඊට පෙර අදාළ වාරික ගෙවීමට අපොහොසත් වුවහොත් බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ නොකිරීමටත්, අධිකරණමය ක්‍රියාමාර්ගවලට පිවිසීමටත් කටයුතු කරනු ලැබේ. එකී 2023 හිඟ බදු ගෙවීම කළ යුත්තේ 2023 ඉතිරි කාල සීමාවට අදාළ බදු නියමිත කාල සීමාව තුළදී ගෙවීමට යටත්වය. අපි මේ සියල්ලම යම්කිසි නිශ්චිත තැනකට ගේන්න හදන්නේ, මේ හිඟ නැති වෙන්නයි. අපි කාලය දීලා තිබෙන්නේ මේ අවුරුද්දේ ඉතිරි මාස දෙක සඳහා විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2023 වසරට පෙර කාල සීමාවට අදාළ හිඟ බදු සම්බන්ධයෙන් පවතින නඩු කෘත්‍යයන්ට අදාළ නියෝග හා උපදෙස්වලට පටහැනි නොවන සේ හා නීතිපති උපදෙස් අනුව මාසයක කාල සීමාවක් ඇතුළතදී නව ගෙවීම් සැලසුම් ලබාදී ගිවිසුම්ගත වීමට මේ වනවිට කටයුතු කරමින් පවතී.

08. 2023.10.30 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මඟින් ආනයනික සීනි කිලෝවක් මත පනවා තිබූ ශත 25ක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 50ක් දක්වා ඉහළ නැංවීමට රජය යෝජනා කරන ලදී. මෙය රජයේ ආදායම ඉහළ නැංවීමේ උපාය මාර්ගයක් ලෙස ක්‍රියාත්මක කිරීමටද යෝජනා කරන ලදී. ඊට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.10.30වැනි දින ලැබුණු අතර, අදාළ ගැසට් නිවේදනය 2023.10.31 නිකුත් කරන ලදී.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථම වතාවට තමයි විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සඳහා අපි කැබිනට් අනුමැතියත් අරගෙන තිබෙන්නේ. ඒ, මෙහි තිබෙන වැදගත්කම නිසායි. මේකේ දෙපැත්තක් තිබෙනවා. සමහරු කියනවා, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මධ්‍යම රාත්‍රියේ පැනෙව්වාම ප්‍රශ්නයක් කියලා. හැබැයි, එහි තිබෙන විශේෂ රහස්‍යභාවයේ අවශ්‍යතාව නිසා තමයි අපි විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවනකොට එකවරම රාත්‍රියේ එම ගැසට් නිවේදනය නිකුත් කරන්නේ. ඒ නීතියේම තිබෙනවා, අපට පුළුවන් පළමුවැනි අවස්ථාවේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න කියලා. එහි එක පැත්තක් තිබෙනවා, රහස්‍යභාවය ආරක්ෂා වීමට.

මේ ගැසට් නිවේදනය 2023.10.31 දින නිකුත් කළා. ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ආනයනකරුවන් සතුව පවතින සීනි තොග වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමෙන් ඇති විය හැකි අනිසි බලපෑම අවම කිරීම සඳහා සීනි සඳහා උපරිම සිල්ලර මිලක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් 2023.11.02 දින නියම කරන ලදී.

2023 වසර තුළ වාර්ෂිකව මේ දක්වා සිදුකර ඇති, ආනයනකරුවන් රේගුවෙන් නිදහස් කරන ලද සීනිවලට අදාළ සවිස්තර වාර්තාවක් මේ සමඟ ඇමුණුම 03 වශයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01, 02, 03 මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඔක්තෝබර් මස වනවිට ආනයනය කර ඇති සම්පූර්ණ සීනි ප්‍රමාණය මෙට්‍රික්ටොන් 546,488කි. වැදගත් වනුයේ පූර්ව අත්දැකීම් අනුව බදු වැඩි කිරීම සමඟම උපරිම සිල්ලර මිලක් නියම කිරීමේ නියෝගය කැබිනට් පත්‍රිකාව මඟින් සිදුකර තිබීමයි. මෙය කැබිනට් පත්‍රිකාවේම තිබෙන කොන්දේසියක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ බද්ද පැනවූ වහාම උපරිම සිල්ලර මිලක් නියම කරලා මේකෙන් කිසිම කෙනෙකුට අයුතු ප්‍රයෝජන නොගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවේ නියෝගයක් තිබෙනවා. මොකද, ඊට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණේ 2023.10.30වැනි දා. ඒ ගැසට් නිවේදනය නිකුත් කළේ 2023.10.31වැනි දා. 2023.11.02වැනි දා තමයි සීනි සඳහා උපරිම සිල්ලර මිල නියම වුණේ. ඒ කටයුතු ඉටු වන දින දෙකක කාලය තුළ යම් යම් අපැහැදිලි තත්ත්වයක් විද්‍යමාන වුවද, දැන් තත්ත්වය පාලනය වී ඇති බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වාර්තා කරයි. මම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිතුමා එක්ක දුරකථනයෙන් කථා කළා, මීට මොහොතකට පෙර. ඔහු කියන පරිදි මේ බද්ද පනවන්න පෙර ආනයනය කළ සීනි මෙට්‍රික්ටොන් 35,000ක් රට තුළ තිබෙනවා.

මේ රටේ සීනි මෙට්‍රික්ටොන් 15,000කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. ඒ අනුව සීනි මෙට්‍රික්ටොන් 50,000ක් මේ රට තුළ තිබෙනවා. ඒ නිසා කිසිම සීනි හිඟයක් ඇති වෙන්න විධියක් නැහැ. ඒ නිසාම ඔවුන් දුරකථන අංකයකුත් දීලා තිබෙනවා, නිශ්චිත මිලට වඩා වැඩි මිලකට විකුණනවා නම් 1977 කියන දුරකථන අංකයට දැනුම් දෙන්න කියලා. ඒ අනුව සීනි හිඟයක් ඇති වෙන්නේ නැහැ. මෙට්‍රික්ටොන් 50,000ක් කියන්නේ ලොකු තොගයක්.

ඒ වාගේම සීනි ආනයනය නවත්වා නැහැ. උපරිම සිල්ලර මිල නියම කිරීම මඟින් ආරක්ෂා කළේ රජයට අහිමි වන බදු මුදලක් නොවෙයි. මේ නිසා රජයට බදු මුදලක් අහිමි වෙන්නේ නැහැ. හැබැයි, නව බද්ද පැනවීම නිසා ඒ වනවිට රට තුළ පැවති සීනි තොගවලට ආරෝපණය වන වටිනාකම බැලුවාම, ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ශත 25ක බද්ද රුපියල් 50ක් දක්වා වැඩි කළාම රට තුළ තිබෙන සීනිවල වටිනාකමට රුපියල් 49.75කට වැඩි අගයක් එකතු වෙනවා. අන්න ඒ ආරෝපණය වන වටිනාකම මේ රටේ පාරිභෝගිකයාගෙන් අනිසි ලෙස ලබා ගැනීම වැළැක්වීමට තමයි අපි මේ උපරිම සිල්ලර මිලක් නියම කරනු ලැබුවේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක හරියාකාරව ක්‍රියාත්මක කරන්න නම් මේ සියලු පාර්ශ්ව ඒකට සහයෝගය දැක්විය යුතුයි. අතීත, ආන්දෝලනාත්මක සීනි ආනයන සිද්ධිය පිළිබඳ කටයුතුද නවතා නැහැ.

එසේම 2020.10.14 දින සිට බලපැවැත්වෙන පරිදි සීනි ආනයනය මත පනවන ලද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අඩු

---

*** පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

කිරීම නිසා එම ආනයනකරුවන් විසින් අතිරේක ලාභයක් - පරණ සීනි කථාව ගැනයි මම මේ කියන්නේ- ලබාගෙන ඇද්ද යන්නත්, එසේ අතිරේක ලාභයක් ලබා ඇත්නම් සහ එය ආදායම් බදු ගණනයේදී සැලකිල්ලට ගෙන නොමැති නම්, ඒ මත අදාළ අතිරේක බදු අය කිරීම සඳහාත් මේ වනවිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විගණන කටයුතු ආරම්භ කර ඇත.

ප්‍රධාන සීනි ආනයනකරුවන් අටදෙනෙකු හඳුනාගෙන ඇති අතර, සීනි ආනයනය කිරීමට අමතරව වෙනත් පාරිභෝගික භාණ්ඩ ආනයනය කරනු ලැබීමත්, සීනි ආනයනය මත පනවන ලද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සංශෝධනය 2020.10.14 දින සිට ක්‍රියාත්මක වූ බැවින් 2020/2021 තුළ මාස පහහමාරක කාලයක් සඳහා අදාළවීමත් නිසා විගණන කාර්යය තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් වේ.

කෙසේ වෙතත්, දැනට අදාළ විගණන කටයුතු සිදු කරමින් පවතින අතර -වෙනම කණ්ඩායමක් ඒක කරන්නේ- එය නිමවූ වහාම සවිස්තර වාර්තාවක් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නත් මම බලාපොරොත්තු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වැදගත් යෝජනාවක් කරන්නයි හදන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ නැහැ, කැබිනට් පත්‍රිකාව තුළින් තොරතුරු අනාවරණ වීම ගැන. මම කියන්නේ ඊට පෙර මේ සමාගම්වලට මේ තොරතුරු ගිහිල්ලා ඒ අය යම් යම් කූට ක්‍රම ක්‍රියාත්මක කරනවා කියායි. ඇත්තටම මේකට කියන්නේ, forestalling කියලා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මේ forestalling ක්‍රියාවලිය වළක්වාලන්නට අපේ රටට නව නීති පද්ධතියක් අවශ්‍යයි. ඒ නිසා මම ගරු රාජ්‍ය ඇමතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ බද්ද ශත 25ට අඩු කරනකොටත්, ශත 25 සිට නැවත රුපියල් 50 දක්වා වැඩි කරනකොටත් රජයට අහිමි වුණු මුදල සහ ඒ සිදු වුණු අක්‍රමිකතා පිළිබඳව ඔබතුමාත්, මමත්, මේ රටේ පෙර පාසල් දරුවා වුණත් දන්නවා. ඒ නිසා මේ forestalling ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට බැරි වන ආකාරයේ නව නීති පද්ධතියක් නිර්මාණය කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ පිළිබඳව හොඳ ගවේෂණයක් කරලා තිබෙනවා, Verite Research කියන ආයතනය. Dr. Nishan de Mel මැතිතුමා contact කරලා එතුමාගේත් දායකත්වය අරගෙන මේ forestalling කියන එක වළක්වාලීම සඳහා නීති පද්ධතිය ශක්තිමත් කිරීමට ඔබතුමන්ලාට පුළුවන්. ඒක තමයි මගේ පළමුවන යෝජනාව.

මගේ දෙවන යෝජනාව මෙයයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ කටින්ම කියැවුණා, APIT එකේ target එක තිබුණේ රුපියල් බිලියන 100යි, දැනට රුපියල් බිලියන 107ක් ලැබිලා තිබෙනවා, දෙසැම්බර් 31වැනි දා වෙනකොට රුපියල් බිලියන 150ක් වෙනවා කියලා. එතකොට ඔබතුමාගේම කටින් කියනවා, මේ රටේ වෘත්තීයවේදින්, - professionalsලා - ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, IT engineersලා වාගේ හොඳ වැදගත්, බුද්ධිමත් උගතුන් කණ්ඩායමම overtax කරලා තිබෙනවා කියලා. ඒකයි කරලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ බදු සූත්‍රය වැරදිලා තිබෙනවා. ඒ කියන්නේ, target එක රුපියල් බිලියන 100යි, අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 150යි. දැනට ඒ රුපියල් බිලියන 150න්, රුපියල් බිලියන 107ක් ලැබිලා තිබෙනවා. බලන්න, මේ රටේ වෘත්තීයවේදින් - professionalsලා - මැද පන්තිය ඔබතුමන්ලා overtax කරලා තිබෙනවා. ඔබතුමාගේම උත්තරයෙන් කියනවා, මේ අරක්කු සමාගම්වලින් රුපියල් මිලියන 2,700ක බදු මුදල අය කරලා නැහැ කියලා. ඉතින්, මම ඔබතුමාට කියන්නේ මෙන්න මේ කරුණු හොඳට සැලකිල්ලට අරගෙන අර overtax කරපු වෘත්තීයවේදින්ගේ ඒ taxes ටික ආපසු ලබා දෙන්න ක්‍රමයක් හදන්න කියායි.

ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමනි, තුන්වන කාරණය මෙයයි. මේක වැදගත් කාරණාවක්. ඔබතුමා දන්නවා, මේ රටේ ජනතාව කාලයෙන් කාලයට පිරමීඩ ජාවාරම නිසා බරපතළ ගැටලුවකට පත් වෙන බව. මම ඒකට මහ බැංකුවටවත්, ඔබතුමන්ලාටවත් චෝදනා කරන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා ඕනෑ තරම් මේ පිළිබඳව දැන්වීම් දාලා තිබෙනවා. නමුත් අලුත්ම - latest - වංචාව වන "OnmaxDT" කියන පිරමීඩ වංචාව නිසා මේ රටේ විශාල පිරිසක් මංමුළා වෙලා තිබෙනවා. පව්! ඒ අය. ඇත්තටම මට නම් හිතා ගන්න බැහැ, මේ ලියාපදිංචි නැති පිරමීඩ වංචා කෙරෙනවා කියන එක දැන දැනත් අපේ රටේ මිනිස්සු ඒවාට හසු වෙන්නේ ඇයි කියලා. ඔබතුමාම දන්නවා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ "දඬුවම්, දැඩි දඬුවම්, පොඩි දඬුවම්" කිය කියා ඒ පිරමීඩ ජාවාරම ක්‍රියාත්මක වුණු බව. මම ඔබතුමාට කියන්නේ මෙන්න මේකයි. මේ "OnmaxDT" වාගේ පිරමීඩ ජාවාරම් සඳහටම නැති කරන්නට යම්කිසි අලුත් නීති පද්ධතියක් අවශ්‍යයි. මේ පිරමීඩ ජාවාරමම ඉලක්ක කරගෙන ඔබතුමන්ලා අලුත් නීති සම්පාදනයකට ප්‍රවේශ වෙන්න. ඒ සඳහා විපක්ෂයේ අපටත් ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙන්නම්. මේ "OnmaxDT" වාගේ හොර ජාවාරම්කාරයෝ මේ රටේ අහිංසක ජනතාවගේ, වැඩ කරන ජනතාවගේ, සාමාන්‍ය ජනතාවගේ මුදල්වලට පික්පොකට් ගහන ක්‍රියාදාමය, අසීමිත ප්‍රතිලාභයක් ලබා දෙනවා කියන පොරොන්දුව මත මිනිස්සුන්ගේ ජීවිත විනාශ කරන, කාලකණ්ණි කරන මේ ක්‍රියාදාමය වළක්වන්නට මේ තිබෙන නීති පද්ධතිය මදි. මේ පිරමීඩ ජාවාරම් කේන්ද්‍ර කරගෙනම අලුත් නීති පද්ධතියක් ගෙන ඒම යෝග්‍යයි කියලා මම යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා කාරණා තුනක් ඇහුවා. මම කියන්නේ මේ තොරතුරු එළියට ගියේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් කියන එක නොවෙයි. දින කිහිපයක් තුළ මේ ගැන සමාජයේ කථා බහට ලක් වුණා. ඒක තමයි හේතුව. ඒ නිසා තමයි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වහාම පැනවීමට ඒ නීතිය තුළින්ම ඉඩ තිබෙන්නේ. ඉතින් අපි මේවා ප්‍රායෝගිකව බලන්න ඕනෑ කාරණා. නමුත් මම කිව්වා, අපි මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය වෙනකොට සීනි මෙට්‍රික්ටොන් 546,488ක් ගෙනැවිත් තිබෙනවා කියලා. අපි හැම මාසයකම අරගෙන බැලුවොත්, ජනවාරි මාසයේ ගෙනැවිත් තිබෙන්නේ, මෙට්‍රික්ටොන් 60,622යි; පෙබරවාරි මාසයේ මෙට්‍රික්ටොන් 64,229යි; මාර්තු මාසයේ මෙට්‍රික්ටොන් 97,936යි; අප්‍රේල් මාසයේ මෙට්‍රික්ටොන් 55,675යි; මැයි මාසයේ මෙට්‍රික්ටොන් 93,476යි; ජූනි මාසයේ මෙට්‍රික්ටොන් 34,347යි; ජූලි මාසයේ මෙට්‍රික් ටොන් 18,654යි; අගෝස්තු මාසයේ මෙට්‍රික් ටොන් 30,126යි; සැප්තැම්බර් මාසයේ මෙට්‍රික්ටොන් 34,725යි; ඔක්තෝබර් මාසයේ මෙට්‍රික්ටොන් 56,698යි. වැඩිම ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන්නේ මාර්තු මාසයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අසාමාන්‍ය වැඩිවීමක් කොයි මාසයකවත් වෙලා නැහැ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියූ ආකාරයට උපයන විට ගෙවීමේ බද්ද යටතේ ලබපු ආදායම ඉලක්කය ඉක්මවා ගිහින් තිබෙනවා. ඒකට හේතුව තමයි, උපයන

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

විට ගෙවීමේ බද්ද නිශ්චිතවම ගණනය කළ හැකි බද්දක් වීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කිව්වා වාගේ උපයන විට ගෙවීමේ බද්ද ගෙවන ප්‍රජාවට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ අය මේ රටේ උගත්, බුද්ධිමත් පිරිසක්. හැබැයි, අපට සිද්ධ වෙලා තිබෙනවා, රුපියල් බිලියන 65කට තිබුණු සහනාධාර බිලියන 270 දක්වා ගිහිල්ලා අද මේ රටේ ජනතාවට ලබා දෙන්න. මේ සියල්ලේම බර අපි සමානව දරා ගන්න අවශ්‍යයි. හැබැයි, ඉදිරියේදී මම කිව්වා අර RAMIS වාගේ වැඩසටහන් තුළ සාමාන්‍ය බදු ගෙවන්නාත්, උපයන විට බදු ගෙවන්නා සේ සමානවම නිශ්චිතව තමන්ගේ ආදායම පෙන්වන තැනකට පත් වෙනවා කියලා. අන්න ඒ බදු ගෙවීම ශක්තිමත් වුණාම මේ කියන කාරණා පිළිබඳව අපට සලකා බලන්න පුළුවන්. මම පැහැදිලිව කිව්වා, ඔවුන්ගේ බදු බර අඩු කිරීම ගැන අපි සොයා බලනවා, ඒ ගැන අවධානය යොමු කරනවා කියලා.

මම අවසාන වශයෙන් කියන්න ඕනෑ, පිරමිඩ වාගේම ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනු පිළිබඳවත් ලොකු ප්‍රශ්නයක් අපේ රටේ තිබෙන බව. රජය මේවා හඳුනාගෙන නීති ඉදිරිපත් කරමින්, නීති සොයා බලමින්, යුගයට ගැළපෙන නීති, යාවත්කාලීන නීති ගෙන එමින් කටයුතු කරනවා. හැබැයි, විපක්ෂ නායකතුමා කිව්වා වාගේම මේක සාමාන්‍ය ජනතාවත් ඔළුවට ගන්න ඕනෑ කාරණාවක්. දඩුවම් මුදලාලිගේ සිදුවීම වෙලා දැන් අවුරුදු කොච්චරක්ද? හැබැයි, ඒ පිළිබඳව පත්තරවල පිටු ගණන් තිබුණු විස්තර සියල්ලම කියවපු අය තමයි විශේෂ ලාභයක් තිබෙනවා නම්, නැවතත් මේවායේ පැටලෙන්නේ. ඉතින් රජයේ වගකීම, මහ බැංකුවේ වගකීම වාගේම සමස්ත සමාජයටත් මේ පිළිබඳ වගකීමක් තිබෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියයි ගන්නේ.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. රජයේ සේවකයන්, ඒ වාගේම වෘත්තිකයන්ගෙන් මේ බද්ද වශයෙන් රුපියල් බිලියන 50ක් වැඩියෙන් අය කරගෙන තිබෙනවා. ඒ මුදල් refund කරනවාද? ඒ අය බලාගෙන ඉන්නේ refund එකක්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
බදු සම්බන්ධයෙන් එහෙම සාකච්ඡාවක් දැනට නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා දැන් එක බද්දක් පෙන්වලා එහෙම අහනවා. හැබැයි, ඇයි අපට මේ VAT එක සියයට 18ක් කරන්න සිද්ධ වුණේ? සියයට 15 තිබුණු VAT එක සමස්ත ජනතාවගෙන් සියයට 18ක් අය කරන්න සිද්ධ වුණේ ඇයි? අපේ බදු ඉලක්කවලට අපි ළඟා වෙලා නැහැ. මේක පක්ෂ, විපක්ෂ කියලා ඇඹිල්ල දිගු කර ගන්න අවශ්‍ය කථාවක් නොවෙයි.

ඊට වඩා පුළුල්ව අපි මේ දිහා බලන්න ඕනෑ. හැබැයි, අපේ බදු පදනම සමස්ත වශයෙන් පුළුල් කර ගත්තාට පසු මේ කියන ආපසු ගෙවීම්, අඩු කිරීම් ගැන කථා කරන්න පුළුවන්. ඒ නිසා ජනප්‍රිය ප්‍රශ්නවලින් එහාට ගිහිල්ලා රටේ සමස්ත ප්‍රශ්නය හඳුනා ගැනීමේ වගකීමත් විපක්ෂයට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම තව කාරණයක් කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම රජයේ සේවකයෝ ණය අරගෙන තිබෙන්නේ අර පරණ බදු ක්‍රමය අනුව. දැන් මේ අලුත් බද්ද ආවාට පස්සේ පඩියෙන් සතයක්වත් ඉතිරි වෙන්නේ නැහැ කියා සමහර රජයේ සේවකයෝ අපට කියනවා. ඇත්ත වශයෙන්ම දැන් ඒ අයගෙන් වැඩියෙන් අය කර තිබෙනවා බදු සූත්‍රය වැරදීම නිසා. ඉතින් අපි වෘත්තිකයන් -රජයේ සේවකයන්- වෙනුවෙන් ඉල්ලීමක් කරනවා, වැඩියෙන් අරගෙන තිබෙන රුපියල් බිලියන 50 ආපහු ඒ අයට දෙන්න කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවම ඒ ගණන අය වෙලාත් නැහැ. අපි උපකල්පනයක් කළේ. මේ උපකල්පනය මත ඉඳගෙනයි එතුමන්ලා ආපහු ඒක ගෙවන්න කියන්නේ. ඒක පළමු කාරණය.

දෙවැනි කාරණය මෙයයි. රාජ්‍ය සේවකයන්ගේ වැටුප ගෙවා ගන්න බැරි අවුරුද්දක් -2022- අපි පහු කරලා ඉන්නේ. ඒ වැටුප අඩු කරන්න කියා යෝජනා තිබුණා, දෙවතාවකට ගෙවන්න කියා යෝජනා තිබුණා. ඇත්තටම දෙවතාවකට ගෙව්වා, විධායක ශ්‍රේණියේ අයට සහ සාමාන්‍ය රාජ්‍ය නිලධාරින්ට. ගරු මන්ත්‍රීතුමනි, එහෙම රටක ඉඳගෙනත් මේ රටේ රාජ්‍ය නායකයා පැහැදිලිව කැබිනට් මණ්ඩලයට කිව්වා, අපි මේ වතාවේ වැටුප් වැඩි කරනවා කියලා. ඒ වාගේම පෞද්ගලික අංශයටත් ඒ යෝජනාව කරනවා කිව්වා. විශ්‍රාමිකයා ගැනත් කිව්වා. ඇයි ඒ?

අපේ රටේ රාජ්‍ය සේවකයෝ දාහතරලක්ෂයක් ඉන්නවා. විශ්‍රාමිකයෝ හයලක්ෂයක් පමණ ඉන්නවා. ඔබතුමා බලන්න, විසිලක්ෂයකට රුපියල් 1,000ක් වැඩි කරන්න කොච්චර මුදලක් අවශ්‍ය ද කියලා. ඒ නිසා මේ ප්‍රශ්නය දෙස පුළුල්ව බලන්න මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමා සූදානම්. අපි එය බලමු, 13වෙනි දා ඉදිරිපත් කරන අය වැය යෝජනාවලදී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කරුණු දැක්වීම කෙටි කරන්න. ලොකු වෙලාවක් ගත වෙලා තිබෙනවා ඔබතුමාගේ ප්‍රශ්නයට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමා එක්ක වාදයකට යනවා නොවෙයි. ඔබතුමා මම අහපු ප්‍රශ්නයට බොහොම පැහැදිලිව උත්තරයක් දුන්නා, රුපියල් බිලියන 100යි ඉලක්කය තිබුණේ, දැන් ඒ ඉලක්කය අබිබවා රුපියල් බිලියන 107ක් ලැබී තිබෙනවා කියලා. ඔබතුමා තමයි උපකල්පනය කළේ රුපියල් බිලියන 150ක් දෙසැම්බර් 31වන දාට ලැබෙනවා කියලා. ඒක අපි කරපු උපකල්පනයක් නොවෙයි. මම අහන්න කැමැතියි, කරුණාකරලා ඒ රුපියල් බිලියන 100 අබිබවා අය වී තිබෙන සියලු මුදල් ටික refund කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා කියනවා පසුගිය අවුරුද්දේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණා කියලා. එහෙම රටක ලූ, හිටියේ. එහෙම රටක් හදන්නට අත ඉස්සුවේත් ඔබතුමන්ලා නේ. රුපියල් බිලියන 600ක, 700ක බදු සහන කෝටිපතියන්ට ලබා දීලා බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 12 ඉඳලා සියයට 8 දක්වා අඩු කළේ ඔබතුමන්ලා නේ. එහෙම රටක් නිර්මාණය වුණේ ඔබතුමාත් ඒවාට අත උස්සපු නිසා. ඔබතුමා විතරක් නොවෙයි ඔය පැත්තේ හිටපු ඔක්කෝම අත උස්සපු නිසා. එහෙම බංකොලොත් රටක් නිර්මාණය වුණේ ඔබතුමන්ලා නිසා. ඒ නිසා කියන්න හදන්න එපා, "එක පාරටම අපි වළේ වැටුණා" කියලා. මේක විහින් වළේ වැටීමක්. මේක විහින් නිර්මාණය කර ගත්ත බංකොලොත්භාවයක්. ඒ නිසා මම ඉල්ලීමක් කරන්න කැමැතියි overtax කරපු, ඒ කියන්නේ නියමිත ප්‍රමාණයට වඩා බදු බර පැටවූ ප්‍රමාණය, -දෙසැම්බර් 31 වෙනි දාට රුපියල් බිලියන 50ද, 40ද, 30ද යන්න පිළිබඳ ඔබතුමා උපකල්පනය කර කර ඉන්න ඕනෑ නැහැ - ආපසු ලබා දෙන්න කියලා. ඒකයි අපි කියන්නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ උපකල්පනය කරපු ආකාරයත් පැහැදිලිව තිබෙනවා. සැප්තැම්බර් මාසය දක්වා මාසිකව අය වුණු බදු ප්‍රමාණය ඉදිරි මාස කිහිපය තුළ අය වුණොත් ඒ ප්‍රමාණය ලැබෙනවා කියන උපකල්පනය තමයි තිබෙන්නේ. එය පැහැදිලිව තිබෙනවා. ඒක තමයි විපක්ෂ නායකතුමා ආපසු ගෙවන්න කියන්නේ. හැබැයි, එහෙම නම් විපක්ෂ නායකතුමා යෝජනා කරන්න ඕනෑ මේ අය නොවුණු tax ගන්නා ක්‍රමයකුත්. දැන් ආපහු ගෙවන්න කියන්නේ ජනප්‍රිය දෙයක් හැටියට නේ. හැබැයි, අය නොවුණු බදු ප්‍රමාණය ගන්නත් එතුමා යෝජනාවක් ගෙනෙන්න ඕනෑ. ඒක පළමු කාරණය.

දෙවන කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා නැවතත් සාම්ප්‍රදායික විපක්ෂ නායකවරයා බවට පත් වුණා. ඒ නිසා තමයි පසුගිය යුගය ගැන කියමින් ඇඟිල්ල දිගු කරන්නේ. මෙතැනදී ඒවාට ඇඟිල්ල දිගු කරලා බැහැ, කවුරුන් හෝ කර ගහලා මේ තිබෙන තත්ත්වයෙන් රට ගොඩ ගන්න ඕනෑ. ඒක තේරුම් ගන්න එතුමන්ලා උත්සාහ කරන්නේ නැත්නම්, සාම්ප්‍රදායික විපක්ෂය ළඟ තමයි එතුමන්ලා නතර වෙලා තිබෙන්නේ. මේ රට ගොඩ ගැනීමේ චේතනාවක් එතුමන්ලාට නැහැ.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් ද?

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ඔව්. මම ඉතා කෙටියෙන් කියන්නම්. මම පොඩි ඉල්ලීමක් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අහනවා නේ. මම අද අහලා තිබෙන ප්‍රශ්නය මීට මාසයකට, එකහමාරකට උඩදිත් ඇහුවා. මොකක් හෝ ගැටලුවක් නිසා එදා මේ ප්‍රශ්නයට පිළිතුරු දීම කල් දැම්මා. ඒ නිසා මම බලාගෙන හිටියා අද මේ ප්‍රශ්නයට උත්තර ලැබේවි කියලා. ජනතාවගේ ප්‍රශ්න නේ අපි අහන්නේ. උත්තර ලැබෙයි කියලා බලාගෙන ඉන්නකොට අදත් ප්‍රශ්න සඳහා වෙන් කර තිබෙන කාලය අවසානයි කියලා ඒ ප්‍රශ්න ටික මඟ හැරලා ඊළඟ දවසට දැම්මා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මාසයකට විතර න්‍යාය පත්‍රය හදලා නේ තිබෙන්නේ. ඒ කියන්නේ, මේ ප්‍රශ්නය තව මාසයකින් විතර තමයි ආයෙත් න්‍යාය පත්‍රයට එන්නේ. ඒක අප වාගේ මන්ත්‍රීවරුන්ට කරන මහා අසාධාරණයක්. අපේ වාචික ප්‍රශ්න තවත් දවසකට කල් දමන්නේ අපෙන් වෙච්ච වරදක් නිසා නොවෙයි, මේ සභාව ඇතුළේ සිදු වුණු දේවල් නිසා. ඒ හින්දා මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ, අද යම් ප්‍රශ්නයකට උත්තර දෙන්න බැරි නම් ඊළඟට පාර්ලිමේන්තුව කැඳවන දිනයේ පළමුවන ප්‍රශ්නය විධියට ඒ ප්‍රශ්නය ගන්න කියලායි. එහෙම නොවුණොත් ඒ ප්‍රශ්නය අහන්න තව මාස ගණනක් කල් යනවා. ඊළඟ දවසේත් මේ විධියටම වුණොත් එහෙම, ආයෙත් න්‍යාය පත්‍රය හදන කොට තමයි ඒ ප්‍රශ්නය ඇතුළත් වෙන්නේ. මේක අපේ වරදක් නොවෙයි, මේ සභාවේ වරදක්. ඒ නිසා මා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, මේ ප්‍රශ්නය ඊළඟ පාර්ලිමේන්තු දිනයේදී පළමුවැනි ප්‍රශ්නය හැටියට ගන්න කියලායි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර දින හතරකටයි හදන්නේ. ඒ දින හතරෙන් පසුව එන පාර්ලිමේන්තු දිනයට තමයි බොහෝ වෙලාවට ඒ ප්‍රශ්නය ඇතුළත් කරන්න වෙන්නේ. මේ සතියේ පැවැත්වෙන දින හතර සඳහා වන න්‍යාය පත්‍ර මුද්‍රණය කරලා, බෙදා හැරලා, නිවේදනය කරලා - ඒ සියලු කටයුතු අවසන් කරලා - තිබෙන්නේ. ඒ නිසා ඒ න්‍යාය පත්‍රවලට යම් දෙයක් එකතු කරන එක ගැන ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කියන්න ඕනෑ, පෙර වරු 10.30ට ප්‍රශ්න ඇසීමේ කටයුතු අවසන් කරන්න පටන් ගත්තාට පසු, පාර්ලිමේන්තුව තුළ යම් විධියක ක්‍රමවත්භාවයක් ඇති වෙමින් තිබෙන බව. අද විශේෂයෙන් සිදු වුණේ, නිවේදන වැඩි සංඛ්‍යාවක් තිබුණු නිසා ඒවාට වැඩිපුර කාලය ගත වීමයි. ඒ හින්දා ප්‍රශ්න සඳහා වෙන් වූ කාලය යම් ප්‍රමාණයකින් අඩු කරන්න සිදු වුණා. ඉදිරියේදී එහෙම වන එකක් නැහැ කියලා මා හිතනවා. ඒ කෙසේ වෙතත්, ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාව ගැනත් සැලකිලිමත් වෙලා කටයුතු කරන්නම්. අපේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පටන් ගත්තේ පෙර වරු 10.35ට. දැන් වෙලාව පෙර වරු 11.32යි. ඒ කාලයත් කළමනාකරණය කර ගත්තොත් හොඳයි. මොකද, යම් දෙයක් සඳහා ගත වන කාලය වැඩි වන කොට අනෙක් දේවලට තිබෙන කාලයෙන් තමයි අඩු වෙන්නේ.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන. ධීවර අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

## ධීවර කර්මාන්තය මුහුණ දෙන ගැටලු: ධීවර අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மீன்பிடிக் கைத்தொழில் எதிர்கொள்ளும் பிரச்சினைகள்: கடற்றொழில் அமைச்சரினது கூற்று
## ISSUES FACED BY FISHING INDUSTRY: STATEMENT BY MINISTER OF FISHERIES

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2) இன்கீழ் கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் 09.08.2023ஆம் திகதி 08 வினாக்களை எழுத்து மூலமாகவும் 05 வினாக்களை வாய்மொழி மூலமாகவும்